# අතිපූජ්‍ය හේන්පිටගෙදර ඤාණසීහ නාහිමි : බුදුසමයේ නිකායාන්තර හා භාෂාන්තර ඥාන පටුත්වය

ආචාර්ය, ඩබ්. ඇම්. දේශප්‍රිය ගුණසේන

අරමුණ

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය ආරම්භ කොට වසර එකසිය පනහක් සපිරේ. ඒ නිමිත්තෙන් පළ කෙරෙන සමරු ශාස්ත්‍රීය සංග්‍රහයේ, ස්වකීය නිකායෙහි අධිකරණ සංඝ නායක ධුරය දරමින් නිකායාභිවෘද්ධියට හා ශාසනාභිවෘද්ධියට අනල්ප වූ මෙහෙවරක් ඉටු කළ, මෙරට ජාතික දේශපාලනික බලවේගයන්හි පුරෝගාමී වූ රාජකීය පණ්ඩිත, හේන්පිටගෙදර ඤාණසීහ නාහිමිපාණන් වහන්සේගේ ධර්ම-ශාස්ත්‍රීය සේවාවෙහි අංශුමාත්‍රයක් ප්‍රකට කරලීම කාලීන අවශ්‍යතාවකි.

## ප්‍රවේශය

වර්තමාන බොහෝ භික්ෂූහු සමාජාර්ථික, දේශපාලනික අංශයන්හි සක්‍රිය දායකත්වය සැපයීම, භික්ෂුවගේ ප්‍රමුඛ කාර්යභාරය කොට සලකති. එනිසා භික්ෂුවගේ ඓතිහාසික ශාසනික කාර්යභාරය වූ පරියත්ති, පටිපත්ති, හා පටිවේධ යන ත්‍රිවිධ ශාසනය සුරැකීමේ වගකීමෙන් දුරස්ත වෙති. ආධ්‍යාත්මික ශික්ෂණයෙන් බැහැරවෙන භික්ෂූන් වහන්සේ ශාසනික, අධ්‍යාපනික හා ධර්ම-ශෘස්ත්‍රීය කාර්යභාරයෙන් ද දුරස්ත වෙති. මෙරට අනාදිමත් ඉතිහාසයක සිට ධර්ම-ශෘස්ත්‍රීය සේවාවේ උරුමය වීවරය හා සම්බන්ධව පැවතිණි. මෑත යුගයේ ඇති වූ අධ්‍යාපන හා ධර්ම-ශෘස්ත්‍රීය පුනරුදයෙන් පසුව ද එම උරුමය ආරක්ෂා වී පැවතිණ. එහෙත් වර්තමානය වන විට ධර්ම-ශෘස්ත්‍රීය සේවාවේ 'යතිවර සලකුණ' ක්‍රමයෙන් තිලීන වෙමින් පවතී.

20 වන සියවසේ මැද භාගයේ මෙරට දේශපාලනික හා ආගමික ව්‍යාපාරයන්හි පෙරටුව ක්‍රියා කළ ද ආගමික, සාමාජික හා අධ්‍යාපනික කාර්යභාරය මැනවින් ඉටු කළ ආධ්‍යාත්මික ශික්ෂණයෙන් පරමාදර්ශී වූ හේන්පිටගෙදර ඤාණසීහ නාහිමි, වර්තමාන භික්ෂු පරපුරට කදිම ආදර්ශයකි.